# පුරාතන බෞද්ධ විහාර බිතුසිතුවම් සම්ප්‍රදාය පිළිබඳ අප්‍රකට තොරතුරු: මයිල්ල විහාර සිතුවම් ආශ්‍රයෙන් කෙරෙන සිද්ධි අධ්‍යයනයක්

ආර්.ඩී. අරුණ ශාන්ත[1]

ශ්‍රී ලාංකේය බෞද්ධ විහාර බිතුසිතුවම් සම්ප්‍රදය, බෞද්ධ අධ්‍යයනයන්හි නිරත බොහෝ පර්යේෂකයන්ගේ අවධානයට ලක් වූ විෂය ක්ෂේත්‍රයකි. සැබවින්ම එය ආගමික, කලාත්මක, සෞන්දර්යාත්මක වශයෙන් පමණක් නොව සමකාලීන ආයතනිකමය තොරතුරු අධ්‍යයන්හිදී ද අගය කිරීමට ලක් වේ. කාලානුරූපීව බෞද්ධ සමාජයේ ඇතිවන විවිධ වෙනස්වීම් හා පරිවර්තනයන් අධ්‍යයනය කිරීමෙහිලාද විහාර බිතුසිතුවම් මූලාශ්‍රය වශයෙන් සලකනුයේ අනල්ප පිටිවහලකි. මධ්‍යතන යුගයට අදාළව භෞතික වශයෙන් මෙරට විහාර බිතුසිතුවම් පිළිබඳව සප්‍රමාණික සාධක ලැබුණ ද අනුරාධපුර රාජධානි සමයට අයත් සිතුවම් පිළිබඳ තොරතුරු ලැබෙන්නේ අල්ප වශයෙනි. තව ද හමුව ඇති සිතුවම් වුව කොටස් වශයෙන් ශේෂව පැවතීම හා නිරූපිතයන් හරිහැටි නිශ්චය කරගැනීම දුෂ්කර වීම වැනි තත්ත්වයන් හේතුවෙන් සාහිත්‍යය මූලාශ්‍රයවල එන ඇතැම් තොරතුරු වුව තුලනාත්මකව විග්‍රහ කරගැනීමේ අවස්ථාව අහිමිව තිබේ.

එහෙත් මෙහිලා විශේෂ අවධානයට ලක්කරනු ලැබෙන කොටියාගල මයිල්ල විහාරය පුරාතන යුගයට අයත් බෞද්ධ සිතුවම් සහිත, ඒවායේ සංදර්භමය වැදගත්කම නිසිලෙස අවධාරණය නොවුණු පුරාවිද්‍යා ක්ෂේත්‍රයකි. එහි ප්‍රතිමා ගෘහ ද්විත්වයක් ආශ්‍රයෙන් සිතුවම් පෙන්නුම් කෙරේ. උතුරු දෙසට මුහුණලා ඇති ප්‍රතිමා ගෘහය මහායාන බෝධිසත්ව වන්දනය සඳහා වෙන් වූවක් වන අතර වන්දනය උදෙසා බෝධිසත්ව රූප චිත්‍රණය කිරීමේ සම්ප්‍රදාය පිළිබඳ නව තොරතුරු රැසක් ඒ ආශ්‍රයෙන් හඳුනාගත හැකි ය. මෙහි ප්‍රධාන ප්‍රතිමාගෘහය වියනේ ද සිතුවම් ව්‍යාප්තව ඇති අතර එහි ප්‍රධාන පනේල ද්විත්වයක බොධිසත්ව හෝ දේව විමානයක් හා නිරය නිරූපනය කර ඇත. එමෙන්ම වියන් සැරසිලි රැසක් ද දැකගත හැකි ය. අපගේ හඳුනාගැනීම් අනුව එහි නිරූපිත නිරය නම්, ලෝකුඹු නිරයයි. පුරාතන යුගයට අදාළව මෙබඳු වස්තුවිෂයක් නිරූපිත සිතුවමක් වාර්තා වන පළමු අවස්ථාව මෙය වේ. එබඳු වස්තුවිෂයක් විස්තරාත්මකව විහාර බිතු සිතුවම් අතරට ගෙන ඒමට මෙහි යෙදූ ඇති ප්‍රයෝග විශේෂිත ය.

මයිල්ල විහාරය ආංශුක කලාපය නිරීක්ෂණය කිරීමේ දී මෙය බොහෝදුරට ගැමියන්ගේ ආගමික අවශ්‍යතාවන් උදෙසා තැනුණු විහාරයක් බව පෙනීයන අතර ඔවුනට ගෝචර වන මෙන්ම සමාජ ශෝධනයක් අපේක්ෂාවෙන් මෙම සිතුවම් නිර්මාණය වන්නට ඇත. මෙය මෙරට පුරාතන විහාර බිතුසිතුවම් සම්ප්‍රදය පිළිබඳ අධ්‍යයනයේදී මේ සම්බන්ධයෙන් හමුවන දුර්ලභ නිදර්ශනයක් වන අතර මයිල්ල විහාර සිතුවම් ආශ්‍රයෙන් ඒ පිළිබඳ තවදුරටත් සාකච්ඡා කිරීමට මෙහිලා අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පද:** බෞද්ධ විහාර බිතු සිතුවම්, මයිල්ල විහාරය, පුරාතන යුගය, බෝධිසත්ව රූප, ලෝකුඹු නිරය

1 සහය කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයනය අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.
Email: arushantha33@gmail.com